# 2026 ජූලි

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

## 2026 ජූලි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

**නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2026 ජූලි මාසයේ දී 55.0ක දර්ශක අගයක් වාර්තා කරමින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළේය.** සියලුම උප දර්ශක මෙම වර්ධනය සඳහා ධනාත්මකව දායක විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකවල සමස්ත වර්ධනයට ප්‍රධාන වශයෙන් ආහාර හා පාන නිෂ්පාදන අංශයේ ශක්තිමත් කාර්යසාධනය හේතු විය. නිෂ්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ ධනාත්මක අපේක්ෂාවන් පිළිබිඹු කරමින්, සේවා නියුක්ති සහ තොග මිලදී ගැනුම් උප දර්ශක ජූලි මාසයේ දී වර්ධනය විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසය තුළ දීර්ඝව පැවති අතර, එමගින් සැපයුම් දාමයේ පවතින අඛණ්ඩ පීඩනයන් පෙන්නුම් කෙරේ.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**


| විචල්‍යය | 2026 ජුනි | 2026 ජූලි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **53.0** | **55.0** | **+** | **වැඩි වේගයකින් ඉහළ යැමක්** |
| නව ඇණවුම් | 50.0 | 55.9 | + | කඩඉම් මට්ටමේ සිට ඉහළ යැමක් |
| නිෂ්පාදන | 52.0 | 54.5 | + | වැඩි වේගයකින් ඉහළ යැමක් |
| සේවා නියුක්තිය | 50.5 | 51.0 | + | වැඩි වේගයකින් ඉහළ යැමක් |
| තොග මිලදී ගැනුම් | 56.6 | 51.5 | - | අඩු වේගයකින් ඉහළ යැමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 61.6 | 61.5 | - | අඩු වේගයකින් ඉහළ යැමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන අංශය ගෝලීය පරිසරයේ පවතින අවිනිශ්චිතතා මධ්‍යයේ සැලකිලිමත් වෙමින් ඉදිරි මාස තුන සඳහා ද ධනාත්මක අපේක්ෂාවකින් පසු වේ.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
2026 ජූලි
**55.0**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | අඩු වේගයකින් ඉහළ යැමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යැමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යැමක් |
| එක්සත් ජනපදය | සමාන වේගයකින් ඉහළ යැමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් ඉහළ යැමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් ඉහළ යැමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 අගෝ. 17 වන දිනට (PMI Releases (spglobal.com))*

*[1] එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සේවා ක්‍රියාකාරකම්වල වේගවත් වර්ධනයක් පෙන්නුම් කරමින්, 2026 ජූලි මාසයේ දී දර්ශකාංක 61.4ක අගයක් වාර්තා කළේය.**

පුළුල් ආංශික වැඩිදියුණු වීම්වල සහාය ඇතිව, 2026 ජූලි මාසයේ දී සේවා අංශයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් ප්‍රසාරණය විය. ප්‍රධාන වශයෙන් ප්‍රවාහනය, මූල්‍ය සහ වෘත්තීය සේවා යන උප අංශයන්හි වර්ධනය මෙම ප්‍රසාරණය සඳහා හේතු වූ අතර, අනෙකුත් පෞද්ගලික සේවා උප අංශ ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

2026 ජූලි මාසයේ දී නව ව්‍යාපාර ප්‍රසාරණය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රවාහන සහ වෘත්තීය සේවා උප අංශයන්හි ඉහළ යෑම් බලපෑවේය. මූල්‍ය සහ අනෙකුත් පෞද්ගලික සේවා උප අංශ ද මෙම වර්ධනයට දායක විය.

නව සේවක බඳවා ගැනීම් සහ සේවක ඉල්ලා අස්වීම් මන්දගාමී වීම හේතුවෙන් 2026 ජූලි මාසයේ දී සේවා නියුක්තිය ඉහළ ගියේය. මේ අතර, නිම කිරීමට ඉතිරිව ඇති කාර්යයන් පෙර මාසයට සාපේක්ෂව වැඩි විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2026 ජූනි | 2026 ජූලි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **58.5** | **61.4** | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **නව ව්‍යාපාර** | 62.5 | 60.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **සේවා නියුක්තිය** | 54.0 | 52.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **නිම කිරීමට නියමිත කාර්යයන්** | 50.0 | 51.2 | + | කඩඉම් මට්ටමේ සිට ඉහළ යෑමක් |
| **අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්** | 72.7 | 75.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි කාර්තුව සඳහා ව්‍යාපාරික ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2026 ජූලි මාසයේ දී තවදුරටත් ශක්තිමත් වූ අතර, අපේක්ෂිත ආර්ථික තත්ත්වයන්හි වැඩිදියුණු වීම් සහ මහනුවර ඇසළ පෙරහැර සමයේ සංචාරක පැමිණීම ඉහළ යෑම ඒ සඳහා සහාය විය. කෙසේ වෙතත්, පුළුල් ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා ඉදිරි දැක්මට අහිතකර අවදානම් තවදුරටත් එල්ල කරයි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**2026 ජූලි**

**61.4**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 අගෝස්තු 17 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ හරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.